# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.14 පැය 1530 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 735/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

**01. මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - මීනුවන්ගොඩ පොලිස් වසම.**

2025.04.13 වන දින සවස් කාලයේ මීනුවන්ගොඩ පොලිස් වසමේ දෙවලපොල ප්‍රදේශයේදී දෙපාශර්වක් අතර ඇති වූ ආරවුලක් හේතුවෙන් පුද්ගලයෙකු විසින් තියුණු ආයුධයකින් පහරදීමෙන් බරපතල තුවාල ලැබූ පුද්ගලයෙකු ප්‍රතිකාර සඳහා මීනුවන්ගොඩ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට මීනුවන්ගොඩ පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමශර්න ආරම්භ කර තිබිණි.

සිද්ධියට සම්බන්ධ සැකකරු සිද්ධියෙන් පසු ප්‍රදේශය හැර පලා ගොස් තිබූ අතර මීනුවන්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැඩිදුර විමශර්න ආරම්භ කර 2025.04.14 වන අද දින උදෑසන කාලයේ මීනුවන්ගොඩ ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 65 ක් වන ගණේමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මීනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. නීති විරෝධි මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා බැරල් 14 ක් පොලිස් භාරයට - කොට්ඨාශ අපරාධ විමශර්න කයර්ාංශය කිලිනොච්චිය.**

වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් පරිදි දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදුකරගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාළව 2025.04.13 වන දින උදෑසන කාලයේදී කිලිනොච්චිය පොලිස් වසමේ පෙරියකුලම් කට්ටකාඩු වැව ප්‍රදේශයේදී කිලිනොච්චිය කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීම් 02 ක් සිදු කර ඇත.

**එහිදි, නීති විරෝධි මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 760 ක් අඩංගු බැරල් 05 ක් හා ගෝඩා ලීටර් 1365 ක් අඩංගු බැරල් 09 ක් පොලිස් භාරයට ගෙන** කිලිනොච්චිය පොලිස් ස්ථානයට භාර දී ඇත.

සිද්ධියට අදාල සැකකරුවන් ප්‍රදේශයෙන් පලාගොස් ඇති අතර අත්අඩංගුවට ගැනීම සඳහා කිලිනොච්චිය පොලිසිය වැඩිදුර විමශර්න පවත්වාගෙන යනු ලබයි.

මෙයට අදාළ ඡායාරූප කිහිපයක් මේ සමඟ එවමි.

## 03. මාරක රිය අනතුරක් - අග්බෝපුර පොලිස් වසම.

2025.04.14 වන අද දින උදෑසන කාලයේ අග්බෝපුර පොලිස් වසමේ කන්තලේ - ත්‍රිකුණාමලය මාගර්යේ 85 කණුව ආසන්නයේදී අග්බෝපුර සිට කන්තලේ දෙසට ගමන් ගත් කැබ් රථයක පිටුපස එම දිශාවටම ධාවනය වූ බස් රථයක් ගැටීමෙන් පසු ඊට ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි ලොරි රථයක එම බස් රථය ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බස් රථයේ රියදුරු හා එහි ගමන් ගත් කුඩා දරුවන් ඇතුළු 20 දෙනෙකු තුවාල ලබා කන්තලේ රෝහලට ඇතුලත් කිරීමේදී බස් රථයේ රියදුරු මියගොස් ඇත.

**මරණකරු මාවනැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය කන්තලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අග්බෝපුර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**